# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගයශාලාව

# රෝහල් ඇබෑර්තු

1. අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍ය තනතුර
2. හෘද හා උරස් ශල්‍ය විශේෂඥ වෛද්‍ය තනතුර
3. කායික රෝග විශේෂඥ වෛද්‍ය තනතුර

ඉහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. අක්ෂි ශල්‍ය විශේෂඥ වෛද්‍ය තනතුර

**සුදුසුකම් :** කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍යවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM) මගින් පිරිනමනු ලබන අක්ෂි ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ MD මණ්ඩල සහතිකය හිමි විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනයෙහි විශේෂඥ ලියාපදිංචි අංකයක් සහිතව ලියාපදිංචි වී තිබිය යුතුය.

## 2. හෘද හා උරස් ශල්‍ය විශේෂඥ වෛද්‍ය තනතුර

**සුදුසුකම් :** කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM) මගින් පිරිනමනු ලබන, හෘද හා උරස් ශල්‍ය වෛද්‍යවිද්‍යාව පිළිබඳ MD/MS මණ්ඩල සහතිකය හිමි, රජයේ හෝ පෞද්ගලික රෝහල්වල සේවය කරනු ලබන විශේෂඥ වෛද්‍ය නිලධාරීන්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනයෙහි විශේෂඥ ලියාපදිංචි අංකයක් සහිතව ලියාපදිංචි වී තිබිය යුතුය.

## 3. කායික රෝග විශේෂඥ වෛද්‍ය තනතුර

**සුදුසුකම් :** කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM) මගින් පිරිනමනු ලබන, කායික රෝග වෛද්‍ය විද්‍යාව පිළිබඳ MD/MS මණ්ඩල සහතිකය හිමි රජයේ හෝ පෞද්ගලික රෝහල්වල සේවය කරනු ලබන විශේෂඥ වෛද්‍ය නිලධාරීන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) විශේෂඥ වෛද්‍යවරුන්ගේ ලේඛනයෙහි විශේෂඥ ලියාපදිංචි අංකයක් සහිතව ලියාපදිංචි වී තිබිය යුතුය.

## සියලුම තනතුරු සඳහා පොදු කොන්දේසි

**වයස :** අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. වයස අවුරුදු 50 ට අඩු අයදුම්කරුවකු නොමැති අවස්ථාවකදී වයස අවුරුදු 50 ට වැඩි අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම සඳහා සලකා බලනු ලැබේ.

**වැටුප් පරිමාණය :** SL 03 - රු. 210,000/- - 12x6, 530/- - රු. 288, 360/- මාසිකව.
ඊට අතිරේකව රාජ්‍ය අංශයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**සේවා නියුක්ති කොන්දේසි :** ස්ථිර (වයස අවුරුදු 50 ට අඩු) සහ අර්ථ සාධක අරමුදල් පදනම මත රජයේ තනතුරු හොබවන අයදුම්කරුවන් ඔවුන් සේවය කරනු ලබන දෙපාර්තමේන්තු හී ප්‍රධානීන් හරහා අයදුම්පත් යොමු කළ යුතු අතර පිටපතක් සෘජුව යොමු කළ යුතුය. තනතුර සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අයදුම්කරු නිදහස් කල හැකිබවට ආයතන ප්‍රධානියා වෙතින් ලබාගත් සහතිකයක් අයදුම්පත හා අමුණා එවිය යුතුය.

පත්කිරීම් සිදුකිරීම / නොකිරීම පිළිබඳ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගයශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

කවරයෙහි ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන්, සම්පූර්ණ ජීව දත්ත තොරතුරු සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සහිත අයදුම්පත් 2026 පෙබරවාරි 09 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනය වෙත එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගයශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**

2026-01-21